# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,176 — 1960 අගෝස්තු 5 වැනි සිකුරාද — 5.8.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල්කිරීම පිළිබඳ දැන්වීම් :— | | | |
| ප්‍රාරම්භක දැන්වීම් | ... | ... | — |
| අවසාන නියෝග | ... | ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |

| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් | | ... | 369 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් | | ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් | | ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් | ... | ... | 373 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම | | ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

අංකය : කිව්.ඒ. 574-ජේ 58-59 ඩබ්ලිව්. 894.

### 1954 අංක 39 දරන (සංශෝධිත) පනතින් සංශෝධනය කළ පරිදි 1950 හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ මොහොට්ටාලලාගේ සිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළේ ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ, කඳානේ ගම්මුලාදැනි කොට්ඨාශයේ කඳානේ ඉස්ටේෂන් පාරේ පිහිටි වරිපනම් නො. 91,280 සහ 281 දරණ දඹුගහ වත්ත යන ඉඩමෙන් පර්චස් 02.16ක පමණ ඇති ඉඩම් කැබලි තුනක්.

**(1) පාර්චස් 02.4ක් පමණවූ අංක 91 දරණ දඹුගහවත්තට මායිම්—**

උතුරට: කැරොලයින් අමරතුංග අයිතිකම් කියන දඹුගහවත්ත; නැගෙනහිරට: ඇල්. සී. කරෝලිස් අයිතිකම් කියන දඹුගහ වත්ත; දකුණට: ඒ. ඇස්. කේ. කන්දයියා පිල්ලෙ අයිතිකම් කියන දඹුගහවත්ත; බස්නාහිරට: කොළඹ—මීගමු මහ පාර.

**(2) පාර්චස් 00.8ක් පමණවූ අංක 280 සහ 281 දරණ දඹුගහ වත්තට මායිම්—**

උතුරට: කඳාන ඉස්ටේෂම් පාර; නැගෙනහිරට: කඳාන ඉස්ටේෂන් පාර සහ පාරට වෙන්වී තිබෙන කොටස; දකුණට: ඒ. ඇස්. කේ. කන්දයියා පිල්ලෙ අයිතිකම් කියන දඹුගහවත්ත; බස්නාහිරට: කොළඹ—මීගමු මහ පාර.

**(3) පාර්චස් 00.4ක් පමණවූ අංක 280 සහ 281 දරණ දඹුගහ වත්තට මායිම්—**

උතුරට: කඳාන ඉස්ටේෂන් පාර; නැගෙනහිරට: කඳාන ඉස්ටේෂන් පාර සහ පාරට වෙන්වී තිබෙන කොටස; දකුණට: **ඒ. ඇස්. කේ. කන්දයියා පිල්ලෙ අයිතිකම් කියන දඹුගහ** වත්ත; බස්නාහිරට: ඉස්ටේෂන් පාර සහ පාරට වෙන්වී තිබෙන කොටස.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

1960 ක්වූ ජූලි මස 18 වැනි දින,
කොළඹ දීය.

---

අංකය : ඇල්එච්/ඩී. 32.

### 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:--

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ, බටහිර පස්දුන් කෝරළේ, තුඩුගල ගමේ පිහිටි, අංක ඒ 4,501 දරණ මුල් සැලැස්මේ කැබලි නො. 1, 2 සහ 3:--

**කැබලි අංකය. 1**

ඉඩමේ නම: ගිකියනඹිවිට; විස්තරය: මාස 6ක් වූ රබර් පැල 14ක් තිබේ; හිමිකම් කියන අය: රජය සතුය; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 07.0

**කැබලි අංකය. 2**

ඉඩමේ නම: ගිකියනඹිවිට; විස්තරය: මාස 6ක්වූ රබර් පැළ 65ක් තිබේ; හිමිකම් කියන අය: දොන් එඩ්මන්ඩ් විජේගුණරත්න, තුඩුගල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 22.0

**කැබලි අංකය. 3**

ඉඩමේ නම: ගිකියනඹිවිට; විස්තරය: අවුරුදු 3 ක්වූ රබර් ගස් 21ක් සහ අවුරුදු 30 ක්වූ පොල් ගස් 3ක් තිබේ; හිමිකම් කියන අය: සමරවීර මුදලිගෙ ඩේවිඩ්, තුඩුගල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 32.1

**මුළු ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 21.1**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 සැප්තැම්බර් 30 වැනි දින පූ. භා. 10.30 ට මතුගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 සැප්තැම්බර් 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

කේ. බී. දිසානායක,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1960 ජූලි 28 වැනි දින,
කළුතර කච්චේරිය.

---

අංකය : ඇල්එච්/බී. 33.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බටහිර පස්දුන් කෝරළේ, වලල්ලාවිටි පත්තුවේ, ඉත්තෑපාන ගමේ පිහිටි, අංක 78 දරණ අවසාන ගම් සිතියමේ අංක 8 දරණ අතිරේකයේ කැබලි අංක 504:--

**කැබලි අංකය. 504**

ඉඩමේ නම: කිතුල්ගහහේන; විස්තරය: රබර්, අවුරුදු 30 සිට 35 දක්වාවූ රබර් ගස් 237ක් ඇත; හිමිකම් කියන අය: දොස්තර ඇල්. ඒ. පරණවිතාන මහත්මයා, මාලඹේ වත්ත, ඉත්තෑපාන; ප්‍රමාණය: අ. 2, රූ. 0, ප. 04.7

**මුළු ප්‍රමාණය : අ. 2, රූ. 0, ප. 04.7.**

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 සැප්තැම්බර් 23 වැනි දින පූ. භා. 10.30 ට මතුගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 සැප්තැම්බර් 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

කී. දිසානායක,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1960 ජූලි 27 වැනි දින,
කළුතර කච්චේරිය.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ අඹගමුව කෝරළේ අක්කරවත්ත නොහොත් හාර්ඩෙන්හුයිෂ් නොහොත් නෝර්ටන්බ්‍රිජ් නමැති ගමෙහි පිහිටි ප්‍රමාණයෙන් පර්චස් 34.8ක් වූ මූලික සිතියම් අංක ඒ2,684හි කැබලි අංක 1 සහ 2 යනුවෙන් මැන විස්තර කරන ලද දැනට මෙහි පහත සඳහන් අය විසින් අයිතිවාසිකම් කියනු ලබන ඩොනිබාාක් කොටසෙහි මිඩ්පර්ඩ් වත්ත නමැති ඉඩම් කැබැල්ල :—

සීමාසහිත මිඩ්පර්ඩ් "ලංකා" තේ වතු සමාගම, තැ. පෙ. අංක 65, කොළඹ.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 සැප්තැම්බර් මස 14 වන දින පෙරවරු 10ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1960 සැප්තැම්බර් මස 7 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

තවද ඒ සම්බන්ධ ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරුකර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියලුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඊ. ඇම්. බී. වික්‍රමසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

1960ක්වූ ජූලි මස 26 දින,
මහනුවර කච්චේරියේ දීය.

---

සඳහන් අංකය : ජේ/එල්ජී/2443/එල්බී 2279.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කාර්යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්ම අංක ඒ. 1,768.

පහත සඳහන් ඉඩම් පිහිටා ඇත්තේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ආදායම් නිලධාරි කොටසේ, නාසිමන දකුණේය.

**කැබලි අංකය : 1.**

ඉඩමේ නම : බණ්ඩාරවත්ත නොහොත් බෙල්ලන්කෙටියෙවත්ත ; ඉඩමේ විස්තර : පොල් ඉඩමෙන් කොටසකි, වැවිලි නැත ; අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන් : ටී. එච්. විජේනායක, ග්ලෙන්ලින්, ලේඩි ඩි සොයිසා ඩ්‍රයිව්, මොරටුව, ඊ. බී. ඒ. විජේනායක, විශ්‍රාමලත් සෞඛ්‍ය පරීක්ෂක, අම්බලන්ගොඩ, ඊ. ටී. ඩබ්ලිව්. විජේනායක, කෘෂිකර්ම උපදේශක, මීගමුව, ආතර් විජේනායක මහත්මිය, කළුතර උතුර, කළුතර, ඩේසි අබේසූරිය මහත්මිය, විල්ප්‍රඩ් හවුස්, කොටුවෙගොඩ, මාතර ; බිම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.1.

**කැබලි අංකය : 2.**

ඉඩමේ නම : බණ්ඩාරවත්ත නොහොත් බෙල්ලන්කෙටියෙවත්ත ; ඉඩමේ විස්තර : අවුරුදු 30ක් වයසැති පොල්ගසක් හා අවුරුදු 20ක් වයසැති පොල්ගසක්ද ඇති ඉඩමකි ; අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන් : ටී. එච්. විජේනායක, ග්ලෙන්ලින්, ලේඩි ඩි සොයිසා ඩ්‍රයිව්, මොරටුව, ඊ. බී. ඒ. විජේනායක, විශ්‍රාමලත් සෞඛ්‍ය පරීක්ෂක, අම්බලන්ගොඩ, ඊ. ටී. ඩබ්ලිව්. විජේනායක, කෘෂිකර්ම උපදේශක,

මීගමුව, ආතර් විජේනායක මහත්මිය, කළුතර උතුර, කළුතර, ඩේසි අබේසූරිය මහත්මිය, විල්ප්‍රඩ් හවුස්, කොටුවෙගොඩ, මාතර; බිම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 02.4.

**එකතුව : අ. 0, රූ, 0, ප. 03.5.**

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩම්වලට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960 සැප්තැම්බර් මස 21 දින පෙරවරු 9.30ට මාතර කච්චේරියේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1960 සැප්තැම්බර් 13 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් ඔවුන්ම හෝ ඔවුන්ගෙන් ලියවිල්ලකින් බලයලත් නියෝජිතයන් හෝ ඉහත කී අන්දමට මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

තම තමන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියළු ඔප්පු තිරප්පු හා අනික් ලියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

එච්. ආර්. අමිත්,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

1960 ජූලි මස 26 වැනි දින,
මාතර කච්චේරිය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950යේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1954රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950යේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි. ගල් ඔය සංවර්ධන මණ්ඩලේ ඇලක් කැපීම සඳහා.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්ම අංක ඒ. 1,335. ගම—කලිමඩු

**කැබලි : 1.**

ඉඩමේ නම : පුන්චිකුඩිකාඩු; විස්තර : පාරෙන් කොටසක් හා ඇල ඇති පාලු ඉඩම; අයිතිකම් කියන්නෝ : 2 වැනි කොට්ඨාස තුරනීලා වනගි පදිංචි කනපතිපිල්ලේ නල්ලතම්බි මහතා; ප්‍රමාණය : අ. 1, රූ. 0, ප. 15.

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 සැප්තැම්බර් මස 9 වැනි දින පූර්වභාග 9ට කරවකු සහ නින්දවූර් පත්තුවේ ප්‍රාදේශික ආදායම් නිලධාරීගේ කාර්යාලයේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960 අගෝස්තු මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

අයිතිවාසිකම් ඇති බවට ඔප්පු කිරීම පිණිස තිබෙන සියලුම ලිය කියවිලි විභාග දිනදී මා ඉදිරියේ පෙන්විය යුතුයි. කලිමඩු ගම් මූලාදෑනි වෙත ලබාගන්ට යන ඉඩමේ පිඹුර ඇත. ඉඩමට අයිතිවාසිකම් කියා සිටින්ට හෝ විභාගයට පෙනී සිටින්ට ප්‍රථමයෙන් පිඹුර තියවා බලාද තවත් උවමනා නම් ඉඩම පරීක්ෂණ කළයුතුයි.

ඇස්. කදිර්කාමනාදන්,
මඩකලපු දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප දිසාපති තැන.

වර්ෂ 1960ක්වූ ජූලි මස 22 දින,
මඩකලපු කච්චේරියේදීය.

---

සඳහන් අංකය : 3/61/16—ජේ 55 ඇල් 563.

## 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැණීමේ (සංශෝධිත) ආඥ පනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැණීමේ පනත

### 7 වැනි වගන්තිය යටතේ කරණ දැන්වීමයි

මහජන කාර්යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් රජයට අත්කර ගැනීමට අදහස් කරන බව 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැණීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැණීමේ ආඥ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරණ ඉඩම් :—කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත් පත්තුවේ මල්පානව නමැති ගමේ පිහිටි මෙහි පහත සඳහන් ඉඩම් කැබලි :—

අංක 2895 දරණ අ. ග. සි. 1 වැනි අතිරේකය

**කට්ටි නො. 244.**

ඉඩමේ නම : හැලඹගහමූලවත්ත; විස්තර : අවුරුදු 5 වයසැති කොහොඹගස් 2 සහ මුරුන්ගා ගස් දෙකක් සහිත වත්ත; අයිතිවාසිකම් කියන්නා; ආර්. ඇම්. කේ. බන්ඩා, මල්පානව මොන්නැකුලම; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 02.0.

**කට්ටි නො. 245.**

ඉඩමේ නම : හැලඹගහමූලවත්ත; විස්තර : ඇලෙන් කොටසක් සහ 5 අවුරුදු මුරුන්ගා ගස් 4ක් සහිත වත්ත; අයිතිවාසිකම් කියන්නා; ආර්. ඇම්. කේ. බන්ඩා, මල්පානව, මොන්නැකුලම; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 13.1.

**කට්ටි නො 246.**

ඉඩමේ නම : ගන්සූරියගහමූලවත්ත, හැලඹගහමූලවත්ත; විස්තර : වත්ත (වගාවක් නොමැත); අයිතිවාසිකම් කියන්නා : ආර්. ඇම්. කේ බන්ඩා, මල්පානව, මොන්නැකුලම; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.2.

**කට්ටි නො. 247.**

ඉඩමේ නම : ගන්සූරියගහමූලවත්ත, හැලඹගහමූලවත්ත; විස්තර : ඇලෙන් කොටසක් සහ 5 අවුරුදු මුරුන්ගා ගස් 2, 7 අවුරුදු දෙහි ගසක් සහිත වත්ත; අයිතිවාසිකම් කියන්නා : ආර්. ඇම්. කේ. බණ්ඩා, මල්පානව, මොන්නැකුලම; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 06.6.

**කට්ටි නො. 250.**

ඉඩමේ නම : මාරාගහමූලවත්ත, අඹගහමූලවත්ත; විස්තර: ඇලෙන් කොටසක් සහ අවුරුදු 2 වයසැති දොඩම්පැල 6, අවුරුදු 30 වයසැති අඹගසක්, අවුරුදු 3 වයසැති පොල්පැල 3, අවුරුදු 6 වයසැති පෙල ගසක්, අවුරුදු 40-50ක් වයසැති පොල් ගස් දෙකක් සහිත වත්ත; අයිතිවාසිකම් කියන්නෝ : ඒ. ඇම්. ඒ. පිකිරිරාල, ඒ. ඇම්. ඒ. රන්හාමි, ඒ. ඇම්. ඇම්. උක්කු අම්මා, ආර්. ඇම්. කේ. ජී. බණ්ඩා, සහ ආර්. ඇම්. ඒ. කිරිමැනිකා, මල්පානව, මොන්නැකුලම; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 21.5.

**කට්ටි නො. 251.**

ඉඩමේ නම : අඹගහමූලවත්ත, කෝන්ගහමූලවත්ත, මාරාගහමූල වත්ත; විස්තර : ඇලෙන් කොටසක් සහ අවුරුදු 2 වයසැති කොස් පැලයක්, අවුරුදු 30 වයසැති අඹගසක්, අවුරුදු 2 වයසැති පොල් පැල 8ක්, අවුරුදු 40 වයසැති පොල්ගසක් සහිත වත්ත; අයිතිකම් කියන්නා : ඒ. ඇම්. ටී. රන්හාමි, මල්පානව, මොන්නැකුලම; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 13.3.

**කට්ටි නො. 255.**

ඉඩමේ නම : දන්ගහමූලවත්ත; විස්තර : ඇලෙන් කොටසක් සහිත (වගාවක් නොමැති) වත්ත; අයිතිකම් කියන්නා : එච්. ඇම්. ඩබ්ලිව්. පිකිරි බණ්ඩා, මල්පානව, මොන්නැකුලම; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 14.8.

**කට්ටි නො. 257.**

ඉඩමේ නම : දන්ගහමූලවත්ත; විස්තර : අලෙන් කොටසක් සහිත හේන; අයිතිවාසිකම් කියන්නෝ : ඒ. ඇම්. වී. අප්පුහාමි, ඒ. ඇම්. වී. රන්මැනිකා, ඒ. ඇම්. වී. කිරිමැනිකා, සහ ඒ. ඇම්. ආර්. කව් අම්මා, මල්පානව, මොන්නැකුලම; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 14.1.

**කට්ටි නො. 258.**

ඉඩමේ නම : දිවුල්ගහමූලවත්ත; විස්තර : ඇලෙන් කොටසක් සහිත හේන; අයිතිවාසිකම් කියන්නෝ : ඒ. ඇම්. බී. අප්පුහාමි, ඒ. ඇම්. බී. රන්මැණිකා සහ ඒ. ඇම්. ඇම්. ගුනරත්හාමි, මල්පානව, මොන්නැකුලම; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 09.4.

**කට්ටි නො. 259.**

ඉඩමේ නම : ඇහැටුගහමූලවත්ත; විස්තර : ඇලෙන් කොටසක් සහිත හේන; අයිතිවාසිකම් කියන්නෝ : ඒ. ඇම්. පී. මුදියන්සේ, ඒ. ඇම්. ඒ. පුන්චිරාල සහ ඒ. බී. බී. හේරත් බන්ඩා, මල්පානව, මොන්නැකුලම; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 06.8.

**කට්ටි නො. 260.**

ඉඩමේ නම : දිවුල්ගහමූලවත්ත; විස්තර : ඇලෙන් කොටසක් සහිත හේන; අයිතිවාසිකම් කියන්නා : ඒ. ඇම්. ඇන්. බන්ඩා, මල්පානව, මොන්නැකුලම; ප්‍රමාණය : අ. 0, රූ: 0, ප. 28.5.

**කට්ටි නො. 261.**

ඉඩමේ නම : දිවුල්ගහමූලවත්ත; විස්තර : ඇලෙන් කොටසක් සහ අවුරුදු 20 වයසැති පොල්ගසක් සහිත වත්ත; අයිතිවාසිකම් කියන්නා; ඒ. ඇම්. එච්. රන්හාමි, මල්පානව, මොන්නැකුලම; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 18.2.

**කට්ටි නො. 265.**

ඉඩමේ නම : කෝන්ගහවත්ත ; විස්තර : ඇලෙන් කොටසක් සහිත හේන ; අයිතිවාසිකම් කියන්නා : එච්. ඇම්. පී. මැනික්හාමි, මල්පානව, මොන්නැකුලම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 07.5.

**කට්ටි නො. 266.**

ඉඩමේ නම : කෝන්ගහවත්ත ; විස්තර : හේන ; අයිතිවාසිකම් කියන්නා : එච්. ඇම්. පී. මැනික්හාමි, මල්පානව, මොන්නැකුලම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 00.8.

**කට්ටි නො. 270.**

ඉඩමේ නම : සියඹලාගහහේන ; විස්තර : ඇලෙන් කොටසක් සහිත හේන ; අයිතිවාසිකම් කියන්නා : ඒ. ඇම්. ඩබ්ලිව්. හේරත්හාමි, මල්පානව, මොන්නැකුලම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 20.4.

**කට්ටි නො. 271.**

ඉඩමේ නම : සියඹලාගහහේන ; විස්තර : ඇලෙන් කොටසක් සහිත හේන ; අයිතිවාසිකම් කියන්නා : ඒ. ඇම්. ආර්. කව් අම්මා, මල්පානව, මොන්නැකුලම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 17.5.

**කට්ටි නො. 272.**

ඉඩමේ නම : කෝන්ගහහේන ; විස්තර : අලෙන් කොටසක් සහිත හේන ; අයිතිවාසිකම් කියන්නා : ඒ. ඇම්. වී. රන්මැනිකා, මල්පානව, මොන්නැකුලම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 19.5.

**කට්ටි නො. 273.**

ඉඩමේ නම : කෝන්ගහහේන ; විස්තර : අලෙන් කොටසක් සහිත හේන ; අයිතිවාසිකම් කියන්නෝ : ආර්. ඇම්. කේ. බන්ඩා, ඒ. ඇම්. කේ. කලු බන්ඩා, මල්පානව, ටී. ඇම්. ඒ. සිට්ටම්මා, හල්ඹේ, මොන්නැකුලම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 28.8.

**කට්ටි නො. 274.**

ඉඩමේ නම : කෝන්ගහහේන ; විස්තර : ඇලෙන් කොටසක් සහිත හේන ; අයිතිවාසිකම් කියන්නා : ඒ. ඇම්. කේ. රන් බන්ඩා, මල්පානව, මොන්නැකුලම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 22.6.

**කට්ටි නො. 275.**

ඉඩමේ නම : කෝන්ගහහේන ; විස්තර : ඇලෙන් කොටසක් සහිත හේන ; අයිතිවාසිකම් කියන්නා : ඒ. ඇම්. ඒ. පුන්චිරාල, මල්පානව, මොන්නැකුලම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 15.8.

**කට්ටි නො. 276.**

ඉඩමේ නම : කෝන්ගහහේන ; විස්තර : ඇලෙන් කොටසක් සහිත හේන ; අයිතිවාසිකම් කියන්නා : ඒ. ඇම්. පී. මුදියන්සේ, මල්පානව, මොන්නැකුලම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 09.5.

**කට්ටි නො. 276½.**

ඉඩමේ නම : කෝන්ගහහේන ; විස්තර : හේන ; අයිතිවාසිකම් කියන්නා : ඒ. ඇම්. පී. මුදියන්සේ, මල්පානව, මොන්නැකුලම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 04.3.

**කට්ටි නො. 277.**

ඉඩමේ නම : කෝන්ගහහේන ; විස්තර : හේන ; අයිතිවාසිකම් කියන්නා : ඒ. ඇම්. බී. රන්මැනිකා, මල්පානව, මොන්නැකුලම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 00.2.

**කට්ටි නො. 278.**

ඉඩමේ නම : කෝන්ගහහේන ; විස්තර : ඇලෙන් කොටසක් සහිත හේන ; අයිතිවාසිකම් කියන්නා : ඒ. ඇම්. බී. රන්මැණිකා, මල්පානව, මොන්නැකුලම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 07.7.

**කට්ටි නො. 279.**

ඉඩමේ නම : කෝන්ගහහේන ; විස්තර : ඇලෙන් කොටසක් සහිත හේන ; අයිතිවාසිකම් කියන්නා : ඒ. ඇම්. ටී. අප්පුහාමි, දිවුල්ලැව, නිකවැරටිය ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 03.3.

**කට්ටි නො. 282.**

ඉඩමේ නම : දිවුල්ගහහේන ; විස්තර : ඇලෙන් කොටසක් සහිත හේන ; අයිතිවාසිකම් කියන්නෝ : ආර්. ඇම්. ඇම්. අප්පුහාමි, ආර්. ඇම්. ඇම්. හේරත් බණ්ඩා, ආර්. ඇම්. ඇම්. රන් බණ්ඩා, සහ ආර්. ඇම්. ඇම්. ටිකිරි බණ්ඩා, පහළමාවතගම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 04.6.

**කට්ටි නො. 283.**

ඉඩමේ නම : දිවුල්ගහහේන ; විස්තර : හේන ; අයිතිවාසිකම් කියන්නෝ : ආර්. ඇම්. ඇම්. අප්පුහාමි, ආර්. ඇම්. ඇම්. හේරත් බණ්ඩා, ආර්. ඇම්. ඇම්. රන්බණ්ඩා සහ ආර්. ඇම්. ඇම්. ටිකිරි බණ්ඩා, පහළමාවතගම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 00.8.

**කට්ටි නො. 284.**

ඉඩමේ නම : දිවුල්ගහහේන ; විස්තර : ඇලෙන් කොටසක් සහිත හේන ; අයිතිවාසිකම් කියන්නා ; ඒ. ආර්. එච්. ඇම්. කිරිමුදියන්සේ, ආනමඩුව ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 11.8.

**කට්ටි නො. 285.**

ඉඩමේ නම : දිවුල්ගහහේන ; විස්තර : ඇලෙන් කොටසක් සහිත හේන ; අයිතිවාසිකම් කියන්නා : ඒ. එච්. ඇම්. ටිකිරි බණ්ඩා, ආනමඩුව ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 11.9.

**කට්ටි නො. 286.**

ඉඩමේ නම : දිවුල්ගහහේන ; විස්තර : ඇලෙන් කොටසක් සහිත හේන ; අයිතිවාසිකම් කියන්නෝ : ඒ. එච්. ඇම්. ආර්. ඩින්ගිරි අම්මා, ඒ. එච්. ඇම්. කේ. ජිනදාස, සහ ඒ එච්. ඇම්. කේ. මැක් අම්මා, වඩිගමන්ගාව, ඒ. එච්. ඇම්. කේ. මුතුමැනිකා, බෙලිවැව, ඒ. එච්. ඇම්. ඇස්. අබේසිංහ කුමාරිහාමි, ඒ. එච්. ඇම්. ජයතිස්ස බන්ඩාර, සහ ඒ. එච්. ඇම්. නන්දවතී අබේසිංහ කුමාරිහාමි, කුරුණෑගල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 19.5.

අත්කරගැනීමට අදහස් කරණ ඉහත කී ඉඩම්වලට සම්බන්ධතාවන් ඇති සියලුදෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960 ඔක්තෝබර් මස 13 වෙනි දින පෙරවරු 10.30 ට හල්ඹේ රජයේ පාසැලේ දී මා ඉදිරියේ පෙනී සිටිනු මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද, එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තරද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධව විස්තරද 1960 ඔක්තෝබර් මස 6 වෙනි දිනට හෝ ඊට පෙර පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

ඇම්. ඇල්. ජේ. වික්‍රමරත්න,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

1960 ජූලි මස 27 දා,
කුරුණෑගල කච්චේරියේ දීය.

---

සඳහන් අංකය : ඇල්.ඇම්. 5763.

## 1954 අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුවට අත්කර ගැනීමට අදහස් කරන බව 1954දේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතින් (සංශෝධිත) 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර :—

ප්ලෑන් අංකය : පී.පී.ඒ. 993.

පිහිටීම : සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අටුළුගම් සහ පනාවල් දෙකෝරළේ පනාවල් කෝරළේ බටහිර කොටසේ මෙනේරිපිටිය ගම.

**බිම් කට්ටි අංක : 1.**

ඉඩමේ නම : දෙල්කඩවලේ හේන ; ඉඩමේ විස්තර : රබර් ගස් 3, පොල් ගසක්, කොස් ගසක්, දොඩම් ගස් 2ක්, පුවක් ගස් 36ක්, එක් කොහොඹ ගසක්, කජු ගස් 2ක් සහ ඇස්බැස්ටෝස් වසා ඇති ගෙයි කොටසක් සහිත ඉඩම ; අයිතිකම් කියන අය : පරකඩුවේ, මෙනේරිපිටියේ, පී. එච්. කිරිමැණිකේ, පී. එච්. බබී, පී. එච්. මැන්චි, පී. එච්. ලමදූ, පී. එච්. බබී, පී. එච්. ඩොටියා, පී. එච්. ජේමා, පී. එච්. එලිසා, ඇම්. පී. කිරිහටනා, ඇම්. පී. පාලකිරා සහ ඇම්. පී. පෙරිසේතුවා ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 17.2.

**බිම් කට්ටි අංක : 2.**

ඉඩමේ නම : පුස්සැල්ල වතුයායේ ගල් පුස්සැල්ල කොටස ; ඉඩමේ විස්තර : රබර් ගස් 108 සහිත රබර් ඉඩම ; අයිතිකම් කියන අය : සීමාසහිත කාසන් කම්බබැච් සමාගම, කොළඹ ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 03.0.

**බිම් කට්ටි අංක : 3.**

ඉඩමේ නම : පුස්සැල්ල වතුයායේ ගස්පුස්සැල්ල කොටස ; ඉඩමේ විස්තර : රබර් ගස් 64 සහිත රබර් ඉඩම ; අයිතිකම් කියන අය : සීමාසහිත කාසන් කම්බබැච් සමාගම, කොළඹ ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 22.9.

**බිම් කට්ටි අංක : 4.**

ඉඩමේ නම : කොස්ගහකුඹුර අස්වැද්දුම ; ඉඩමේ විස්තර : රබර් ගස් එකක් සහිත දෙනිය ; අයිතිකම් කියන අය : පරකඩුවේ, පුස්සැල්ලේ, ඒ. කේ. තෝගිස් සිංඤෝ, පරකඩුව, පත්බේරිය ; ඇන්. ජී. මුදලිහාමි, පරකඩුව ; මෙනේරිපිටියේ අයි. පී. සිරියා, ජී. කිරිහටනා සහ පී. එච්. කිරිසංගා ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 21.5.

**බිම් කට්ටි අංක : 5.**

ඉඩමේ නම : කොස්ගහකුඹුර අස්වැද්දුම ; ඉඩමේ විස්තර : දෙනිය ; අයිතිකම් කියන අය : පරකඩුවේ පුස්සැල්ලේ, ඒ. කේ. තේගිස් සිංඤෝ, පරකඩුවේ, පත්බේරියේ, එන්. ජී. මුදලිහාමි, පරකඩුවේ, අයි. පී. සිරියා, පී. එච්. නමින්කිරා, පී. එච්. කිරිහටනා ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 21.7.

**බිම් කට්ටි අංක : 6.**

ඉඩමේ නම : කොස්ගහකුඹුර අස්වැද්දුම ; ඉඩමේ විස්තර : කුඹුර ; අයිතිකම් කියන අය : පරකඩුවේ, ඒ. කේ. තේගිස් සිංඤෝ, පී. මුදලිහාමි, අයි. පී. සිරියා, පී. එච්. නමින් කිරා සහ පී. එච්. කිරිහටනා ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 17.9.

**බිම් කට්ටි අංක : 7.**

ඉඩමේ නම : කොස්ගහකුඹුර අස්වැද්දුම ; ඉඩමේ විස්තර : කුඹුර ; අයිතිකම් කියන අය : පරකඩුවේ, ඒ. කේ. තේගිස් සිංඤෝ, පී. මුදලිහාමි, අයි. පී. සිරියා, පී. එච්. නමින්කිරා, පී. එච්. කිරිහටනා ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 17.9.

**බිම් කට්ටි අංක : 8.**

ඉඩමේ නම : කොස්ගහකුඹුරේ අස්වැද්දුම ; ඉඩමේ විස්තර ; කුඹුර ; අයිතිකම් කියන අය : පරකඩුවේ, ඇම්. පී. සයිමා ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.0.

**බිම් කට්ටි අංක : 9.**

ඉඩමේ නම : මෙනේරිපිටිය වත්ත ; ඉඩමේ විස්තර : තේ පඳුරු 14ක් ඇති තේ ඉඩම ; අයිතිකම් කියන අය : පරකඩුවේ, අයි. එච්. මරික්කාර් ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 05.5.

**බිම් කට්ටි අංක : 10.**

ඉඩමේ නම : ගලහිටිය මහකුඹුර ; ඉඩමේ විස්තර : කුඹුර ; අයිතිකම් කියන අය : පරකඩුව, පුස්සැල්ලේ, ඒ. කේ. තේගිස් සිංඤෝ, ප්‍රමාණය : අ. 0 රූ. 0, ප. 02.1.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 1960 සැප්තැම්බර් මස 22 දින පෙරවරු 9.30ට දෙහිඕවිට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයේදී මා ඉදිරියේ පෙනී සිටිනමෙන් මෙයින් නියම කරමි.

තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද, එම ඉඩම් පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තරද, ඉල්ලන වන්දි මුදල් ප්‍රමාණය සහ එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද 1960 සැප්තැම්බර් 15 වෙනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයිද නියම කරමි.

ඇල්. බී. හුලංගමුව,
කෑගල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප
දිසාපති තැන.

1960 ජූලි මස 28 වැනි දින,
කෑගල්ලේ කච්චේරියේ දීය.

---

## 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:--

පිහිටීම : සබරගමු පලාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, මෙගොඩපත පත්තුවේ දෙහිගම්පල් කෝරළේ සහ පාත බුලත්ගම, හල්ඔලුව ගම.

ප්ලෑන් අංකය: පී. පී. ඒ. 1005.

**බිම් කට්ටි අංක. 1**

ඉඩමේ නම : කුඩුම්රියවත්ත නොහොත් කුඩුම්රිස්සහේන ; ඉඩමේ විස්තර: රබර්, අඹ, කොස්, කජු, පුවක්, කිතුල්, පොල්, දෙල් සහිත තැනින් තැන ගල් සහිත පොල් අතු සෙවිලිකල වරිච්චි බිත්ති, තාවකාලික ගෙයක්ද ඇති වත්ත ; අයිතිකම් කියන අය : චෙට්ටිනාඩ් කෝපරේෂන් අංක 256 හෙට්ටිවීදිය, කොළඹ ; ප්‍රමාණය : අ. 28, රූ. 0, ප. 25

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 සැප්තැම්බර් මස 28 වැනි දින පෙරවරු 9.00 වේලාවට කෑගල්ලේ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1960 සැප්තැම්බර් මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
කෑගල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

වෂී 1960ක්වූ ජූලි මස 29 වැනි දින,
කෑගල්ලේ කච්චේරියේදීය.

---

## ශුද්ධියයි

මගේ අංකය : ඇල්ඒ 1138.

ගරු කෘෂිකම් හා ඉඩම් ඇමති තුමා විසින් නිකුත් කරන ලද, 15.6.59 දින දරණ, අංක 11,823 හා 31.7.59 දින දරණ ගැසට් පතේ ප්‍රසිද්ධ කරන ලද, 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයේ පහත සඳහන් සංශෝධනයන් කළ යුතුයි :—

(1) ඉඩම් පිහිටීමේ විස්තරයේ 'කොළඹතුරේ ග්‍රාමයේ' යන්න 'නැගෙනහිර කොළඹතුරේ ග්‍රාමයේ' යනුවෙන්ද

(2) ඉඩම් මායිම් විස්තරයේ, 'බටහිරින් පුන්කම්කුලම් පාර හා සයිවපිරගාස විද්‍යාශාලය හිමිකම් කියන දේපලද මායිම් වේ' යන්න, 'බටහිරින් පුන්කම්කුලම් පාරද මායිම් වේ' යනුවෙන්ද වේ.

---

## ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

අංකය : ඇල්. ඇස්. 4597.

### 21(2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

වව්නියා දිස්ත්‍රික්කයේ කුරිසුද්දකුලම් මංසන්දියේ පිහිටි අක්කර 1/4ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් විශ්‍රාම ශාලාවක් පිහිටුවීම සඳහා වෙලන්කුලම් ග්‍රාම සංවර්ධන සමිතියේ භාරකරුවන් වන කුමාරන් ඉයම්පිල්ලේ, කදිරවේළු කන්දයියා හා සිතම්පරපිල්ලේ මුත්තයියා යන මහතුන් විසින් බදු ඉල්ලා ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි. ඉඩමෙහි මායිම් මෙසේය :—

උතුරට : කුරිසුද්දකුලම්-මාරයිදුප්ප ගම්සහා පාර ; දකුණට : රජයේ ඉඩම ; නැගෙනහිරට : පුලියන්කුලම්-කන්නියුතු ප්‍රසිද්ධ පාර ; බටහිරට : රජයේ ඉඩම.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :—

(අ) කාලය : අවුරුදු 5යි ;

(ඉ) බද්ද : අවුරුද්දකට රු. 1 යි ;

(උ) බදු ගන්නන් විසින් බද්ද ආරම්භ වූ දින සිට අවුරුදු 2ක් ඇතුළතදී වව්නියා දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි විශ්‍රාම ශාලාවක් තනා නිම කළ යුතුය ;

(එ) බදු ගන්නන් විසින් මෙම ඉඩම විශ්‍රාම ශාලාවක් තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු මස 5 වැනි දින,
කොළඹ දීය.

---

අංකය : ඇල්. ජේ. 1937-ඇල්. ඊ. 2149.

### 21(2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

පුත්තලම් දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළයට අයත් අලුත් තාරකුඩුවිල්ලු ගමෙහි ඉඩම් කැබලි කිරීමේ පිඹුරයේ අක්කර 3ක් පමණ වූ අංක 72 දරණ බිම් කැබැල්ල තාරකුඩුවිල්ලුවේ, චෛත්‍ය වර්ධන සමිතියේ භාරකරුවන් වන, ගොරකානගේ තෝමස් සිල්වා,

සමරවීර චන්ද්‍රසේකර සහ අමරසිංහගේ රොමානිස් සිංඤෝ යන අය වළුන් විසින් එහි බෞද්ධ විහාරස්ථානයක් පිහිටුවීම සඳහා බදු ඉල්ලා ඇත.

2. මීට කිට්ටුම වූ විහාරස්ථානය පිහිටා ඇත්තේ මෙහි සිට සැතපුම් 1½ක් පමණ ඈතින් පිහිටි අඟුණවිල නම් ගමෙහිය. 500ක් පමණ වූ මෙහි වෙසෙන බෞද්ධ ජනයාට මෙම විහාරස්ථානය ප්‍රයෝජනවත් වනු ඇත. ඉඩම බදු දීමට තිබෙන අතර, එය ඒ සඳහාම වෙන්වී ඇත. එබැවින්, රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට ඇත :—

(අ) බදු මුදල : වර්‍ෂයකට රු. 15 යි ;

(ආ) බදුගන්නන් විසින් බද්ද ඇරඹුනු දින සිට අවුරුදු 3ක් ඇතුළතදී, පුත්තලමේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි ඉඩමෙහි විහාරයක්, ධර්මශාලාවක් සහ ආවාසයක් තනා නිම කළ යුතුය. එහි බෝධි වෘක්ෂයක්ද රෝපනය කළ යුතුයි ;

(ඉ) බදු ගන්නන් විසින් මෙම ඉඩම බෞද්ධ විහාරස්ථානයක් තැනීම පිණිස මිස අන් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය ;

(ඊ) බදු ගන්නන් විසින් (ආ) ඡේදයෙහි සඳහන් ගොඩනැගිලි සාදා නිම කොට සමසක් ඇතුළත ඒවා මහා භාරකාර තැනගේ අනුමැතිය ලද ඔප්පුවකින් පූජා කළ යුතුය. මෙසේ කළ පසු, ප්‍රස්ථාවේ හැටියට, භාරකාර තැනට හෝ විහාරස්ථානයේ පාලක විහාරාධිපතීන් වහන්සේට හෝ ඉඩම සඳහා 99 අවුරුද්දක බද්දක් දෙනු ලැබේ.

3. මෙහි පහත දැක්වෙන දිනයේ සිට සති 6ක් ඇතුළතදී මෙකී ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් යථොක්ත ඉල්ලීම පරිදි ඉඩම බදු දෙනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු මස 5 වැනි දින,
කොළඹ දීය.

---

අංකය : ඇල්. කේ. 267 ඒ.

## රජයේ ඉඩම් රෙගුලාසිවල 21(2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

සීප්පුකුලමේ පදිංචි ඇම්. ඇස්. නූර් මොහොමදු මහතා විසින් අනුරාධපුර දිස්ත්‍රික්යේ, නැගෙනහිර නුවර ගම් පළාතේ, සීප්පුකුලම ගමේ කඩවීදියේ පිහිටි 764 වැනි අවසාන ගම් සිතියමේ 47 වැනි කැබැල්ලෙන් රූඩ් 2ක් පමණ වූ රජයේ බිම් කැබෙල්ලක්, පදිංචිය සහ වෙළඳ කටයුතු සඳහා බදු ඉල්ලා ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. ඉල්ලුම් කරුට 1945.3.1 දින වාර්ෂික බලපත්‍රයක් යටතේ දී ඇති මෙම ඉඩමේ රු. 2,500ක් පමණ වටිනා ගොඩනැගිල්ලක් තිබේ. වාර්ෂික බලපත්‍රයක් යටතේ භුක්තිය තවදුරටත් නොගැලපෙන නිසා, රජයේ නියමිත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසිවලටද යටත්ව මෙම බද්ද දීමට අදහස් කර තිබේ :—

(අ) කාලය : අවුරුදු 99යි ;

(ආ) බද්ද : අවුරුද්දට රු. 4.50යි. මෙම බද්ද සෑම අවුරුදු 30කට වරක් සංශොධනය කරනු ඇත. එසේ කිරීමේදී සංශෝධිත බද්ද ඊට කලින් අවුරුදු 30 තුළ තිබුන බද්දට වඩා 50%කට වඩා වැඩි නොවිය යුතුයි ;

(ඉ) බදුකරු විසින් ඉඩම පදිංචිය සහ වෙළඳ කටයුතුවලට මිස අන්කිසි කටයුත්තකට නොයෙදවිය යුතුයි.

3. මෙදින සිට සති හයක් ඇතුළතදී ඊට විරුද්ධව සැහෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් මෙම ඉල්ලීම අනුව බද්ද දෙන්නෙමි.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු මස 5 වැනි දින,
කොළඹ දිය.

---

අංකය : ඇල්. කේ. 267.

## රජයේ ඉඩම් රෙගුලාසිවල 21(2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

සීප්පුකුලමේ පදිංචි සී. බී. සෙනෙවිරත්න මහතා විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාතේ සීප්පුකුලම ගමේ කඩවීදියේ පිහිටි 764 වැනි අවසාන ගම් සිතියමේ 49 වැනි කැබැල්ලෙන් රූඩ් 1ක් පමණ වූ රජයේ බිම් කැබැල්ලක්, පදිංචිය සහ වෙළඳ කටයුතු සඳහා බදු ඉල්ලා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. ඉල්ලුම්කරුට 1938.3.14 දින වාර්ෂික බලපත්‍රයකින් දී තිබුණ මේ ඉඩමේ රු. 2,500 පමණ වටිනා ගොඩනැගිල්ලක් ඇත. බලපත්‍රයක් යටතේ භුක්තිය තවදුරටත් නොගැලපෙන නිසා, රජයේ නියමිත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසිවලටද යටත්ව මෙම බද්ද දීමට අදහස් කර තිබේ :—

(අ) කාලය : අවුරුදු 99යි ;

(ආ) බද්ද : අවුරුද්දකට රුපියල් 2.25යි. සෑම අවුරුදු 30කට වරක් මෙම බද්ද සංශොධනය කරනු ඇත. එසේ කිරීමේදී සංශොධිත බද්ද ඊට කලින් අවුරුදු 30 තුළ තිබුණ බද්දට වඩා 50% කට වඩා වැඩි නොවිය යුතුයි ;

(ඉ) බදුකරු විසින් ඉඩම, පදිංචිය සහ වෙළඳ කටයුතු වලට මිස අන්කිසි කටයුත්තකට නොයෙදවිය යුතුයි.

3. මෙදින සිට සති හයක් ඇතුළතදී ඊට විරුද්ධව සැහෙන කරුණු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් මෙම ඉල්ලීම අනුව බද්ද දෙන්නෙමි.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 අගෝස්තු මස 5 වැනි දින,
කොළඹ දීය.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයක්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. **දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේ යි :—**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම **පස්වරු 3.30ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | 25 | |
| | තැපැල් ගාස්තුවත් සමග ... | 31 | |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | 10 | |
| | තැපැල් ගාස්තුවත් සමග ... | 14 | |

15. **පරණ ගැසට් කොපි තිබේ නම්** ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන්** ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.